# "දෙවියන් වහන්සේ ඔබ සමඟ සිටින බව

*අපි අසා ඇති බැවින්*

# ඔබ සමඟ යන්න අපි කැමැත්තෙමු"

*(සෙකරියා 8 :23)*



# චක්‍රීය ලිපිය

අගෝස්තු 2021

අති උතුම් පෝල් හින්ඩර් රදගුරු OFM CAP

# "දෙවියන් වහන්සේ ඔබ සමඟ සිටින බව

*අපි අසා ඇති බැවින්*

# ඔබ සමඟ යන්න අපි කැමැත්තෙමු"

*(සෙකරියා 8 :23)*

# එඬේරික ලිපිය

අගෝස්තු 2021

අරාබියාවේ විකාරියෙට් දෙකෙහිම සිටිනා විස්වාසිකයින් වෙත ;

සමෝස- ධර්මලාබය, සහභාගිත්වය හා දූතමෙහෙවර යන විෂයන් අලලා ඉදිරි දිනයක පැවැත්වීමට නියමිත (synod ) සමුළුව සම්බන්ධයෙනි.

අති උතුම් පෝල් හින්ඩර් රදගුරු OFM CAP

# පටුන

දේව ජනතාව හා කැටුව, ගමනේ

ශුද්ධාත්මයාණන්ට, එක්ව සවන් දෙමින්

බෞතීස්මය ලැබූ සියළුම දෙනා සමග, විපරමින් ( the gift of "sensus fidei ")

සමුළුවේ ක්‍රියාවලියෙහි නියැලෙමින්

සමුළුවේ ක්‍රියාවලිය ස්ථානික මට්ටමෙන්

"දෙවියන් වහන්සේ ඔබ සමඟ සිටින බව අපි අසා ඇත"

1. ඔබට සාමය වේවා !
සමෝස- ධර්මලාබය, සහභාගිත්වය හා දූතමෙහෙවර යන විෂයන් අලලා ඉදිරි දිනයක පැවැත්වීමට නියමිත (synod ) සමුළුව 2023 සඳහා ගමන් මග ෆ්‍රැන්සිස් ශුද්ධෝත්තම පියාණන් විසින් වර්ෂ 2021, ඔක්තෝබර් මස 9 - 10 දිනයන්හි නිල වශයෙන් , උත්සවාකාරයෙන් ආරම්භ කිරීමට නියමිතයි. ඉන් සතියකට පසු (synod ) සමුළුවේ කාර්යක්‍රමය ලෝකය පුරා ඇති රාජගුරු පදවි සඳහා විවෘත වනු ඇත. උතුරු අරාබි විකාරියේටයට අයත් රටවල් හි ගරු පියවරුන් හා කතිකා කිරීමෙන් පසු , අරාබිකරයේ විකාරියේට් දෙකම සඳහා , පොදු - විධිමත් ආරම්භක උළෙලක් 2021, ඔක්තෝබර් මස සිකුරාදා 15වෙනිදා අබුඩාබි හි සාන්ත ජෝසප් ආසන දෙව් විමනේදී පැවැත්වීමට මම අදහස් කර ඇති බව දන්වනු කැමැත්තෙමි. එකී වැඩපිළිවෙල හා සහභාගීවන්නන් ගැන , කෝවිඩ් -19 අණපනත් වලට යටත්ව, යථා කාලයේ දී දැනුම් දෙනු ලැබේ.

මෙම ලිපිය මගින් (synod ) සමුළුවේ කටයුතු ගැන විග්‍රහයක් කිරීමට අදහස් කරන අතර එයට ක්‍රියාකාරී ලෙසින් සම්බන්ධ වීමට ඔබටද ඇරැයුම් කෙරේ. ශුද්ධවූ පාවුළු තුමන් විසින් එපිසිවරුන්ට ලියූ වදන් මෙහිදී අපි සිහිපත් කරගනිමු. “ එබැවින් ඔබ තවත් විදේශිකයෝවත්, ආගන්තුකයෝවත් නොව, ශුද්ධ වන්තයන් සමඟ සහකාර පුරවැසියෝ ද දෙවියන් වහන්සේගේ පවුලේ දූදරුවෝ ද වෙති. ඔබ ප්‍රේරිතයන්ගේ ද, දිවැසිවරයන්ගේ ද අත්තිවාරම පිට ඉදි කරනු ලැබ සිටින්නහු ය. එහි කොණේ ප්‍රධාන ගල නම් ක්‍රිස්තුන් වහන්සේ ම ය.
(එපීස 2: 19-20)

## දේව ජනතාව හා කැටුව, ගමනේ

2. සිනෝඩ් ( synod ) යන වචනයේ අන්තර්ගත තේරුම කුමක්දැයි බලමු. එය ග්‍රීක් වචනයක් වන අතර, එය ගොනු වී ඇත්තේ syn ( හා කැටුව ) සහ odos ( මාවත හෝ ගමන් මග ) යන්න එකට ඇදීමෙනි . එනයින් බලන කල synod යනු "එකම මාවතේ - එකට ගමනේ " අර්තයයි සභාවේ ආරම්බයේ පටන් විවිධ තරාතිරම් මට්ටමින් ( රාජගුරු පදවි, ප්‍රාදේශීය , පළාත් , පූජක ආරාම නැතහොත් විශ්වීය මට්ටමින් ) සිනෝඩ් ( synod ) කැඳවා ඇත්තේ; කාලයෙන් කාලයට දේව ධර්මය, ජනවන්දනාව. රීති ධර්මය හා එඬේරිකත්වය පිළිබඳව ගැටළු මතුවූ අවස්ථාවන් හී ඒවා විසඳා ගැනීමට අවැසි වූ විට ය.

සම්ප්‍රදායානුකූලව (synod) සමුළුවක් ලෙස සැලකෙන්නේ ලෝකයේ විවිධ දිශා වලින්, තම රාජගුරු පදවි හි විස්වාසිකයින් නියෝජනය කරමින්, රාජගුරු ප්‍රසාදීන් වහන්සේලා එකට අසුන් ගැනීමයි. ඒ කෙසේ වෙතත් ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමන්ට අවැසි වී ඇත්තේ නුදුරු දිනයක පැවැත්වීමට නියමිත සමුළුව වතිකානයේ දී පමණක් පැවැත්වීමට නොව, ලොව පුරා දේශීය සභා මට්ටමින් පැවැත්වීමටය.

මෙම සමුළුවේ ගමන (synod journey ) පුරා වසර තුනක චාරිකාවක් ලෙසින් තුන් අදියරකින් එනම් : රාජගුරු පදවි,මහද්වීප හා විශ්වීය ලෙසින් දියත් කෙරෙනුයේ ඒ සැම අදියරක්ම සමස්ථ දේව ජනතාව හා කැටුව යන පරිපූර්ණ චාරිකාවක ප්‍රතිපලයක් ලෙසිණි.එබැවින් එය හුදෙක් උත්සව -අංගයක් පමණක් නොව දේව ජනතාව සක්‍රිය ලෙසින් ඇදා ගන්නා යාන්ත්‍රණයක් මෙන්ම රෝමයේ හා පාප්තුමන් හා සම්භන්ධ සියළුම රාජගුරු ප්‍රසාදීන් වහන්සේලා සම්බන්ධ වනුයේ එකිනෙකාට අදාළ නිසි දූත කාර්යයට අනුකූලවය. (යොමුව., වර්ෂ 2020 නොවැම්බර් 28 දින, නව කාර්දිනල්වරුන් පත්කළ අවස්ථාවේ කාර්දිනල් මාරියෝ ග්රෙච් හිමිපාණන් විසින් ශුද්ධෝත්තම පියතුමන් අමතා කල කථාව ).

## ශුද්ධාත්මයාණන්ට, එක්ව සවන් දෙමින්

3. ශුද්ධෝත්තම පියතුමන් අදහස් කර ඇත්තේ 'සිනඩොල්' ( synodal ) කාර්ය ක්‍රමය දේශීය සභා සමග තොරතුරු විමසීමකින් ආරම්භ කිරීමටය.පාප් තුමන්ගේ අභිමතය ලොව මුළුල්ලේ ඇති ප්‍රාදේශීය සභාවන් හි සුවිශේෂී අත්දැකීම් වර්ෂ 2023හි රෝමයේ පැවැත්වීමට යෝජිත( synod ) සමුළුවට ප්‍රයෝජනවත් සේ යොදා ගැනීමය . (Bishops Synod ) හි ස්වර්ණ ජුබිලිය සමරමින් 2015, ඔක්තෝම්බර් 17 දින ෆ්‍රැන්සිස් පාප් තුමන් තම දේශනයේදී පහත සඳහන් ආකාරයට 'sinodal' සභාව යනු කෙබඳු දැයි පහදා දෙන ලදී .

*'sinodal' සභාවක් යනු අවධානයෙන් ඇහුම්කන් දෙන , (අවධානයෙන් ඇහුම්කන් දීම යනු හුදෙක් අසා සිටිම පමණක් නොවන බව වටහා ගත් ) සභාවකි. එය සැම කෙනෙක්ම යමක් ඉගෙනගන්නා පොදු සවන් දීමකි. සියළු විස්වාසිකයින් ද , බිෂොප් සංසදය හා රෝමයේ බිෂොප් තැන්පත් ද, එකිනෙකාට සවන්දෙන අතර සැවොම එකතුව ශුද්ධාත්මයාණන් ට " සත්‍යයේ ආත්මයාණන් වහන්සේට" (Jn 14:17) සවන්දෙන්නේ එතුමාණෝ 'සභාවට කුමක් කියන්නේද " (Rev 2:7)යන්න දැනගැනීමටය*

(Bishops Synod ) බිෂොප් සමුළුව යනු සභා ජීවිතයේ සෑම තරාතිරමක්ම ආවරණය කෙරමින් කෙරෙන්නාවූ සවන්දීමේ ක්‍රියාවලියේ සන්නිපාත ලක්ෂයයි ( convergence point ). synod ක්‍රියාදාමය දියත්වෙන්නේ දෙවියන්වහන්සේගේ ජනතාවට එනම් දේව අනාවරණයක් ගෙන ඒමේ වරම් ලත් ජනතාවට සවන් දීමෙනි. ඒ පළමු සහස්‍ර- වර්ෂයේ සභාවට හිතෙෂී වූ මූලික සිද්ධාන්තයක් වූ ( සැමදෙනාටම අදාල වෙන යමක් ඇත්නම් සැමදෙනාම සැලකිය යුතුයි) යන්නට කල්පනාවට ගෙනය. එකී ක්‍රියාවලිය ඉදිරියට ඇදෙන්නේ ඊළඟට පැවිදි පක්ෂයට සවන් යොමු කරමිනි. ( synod ) සමුළුවේ ගරු පියවරුන් හරහා රාජගුරු ප්‍රසාදීන් වහන්සේලා විස්වාසකටයුතු රක්ෂාකාරයින්, තෝල්කයින් හා විශ්වාසයේ සාක්ෂිකරුවන් ( මුළු සභාවම ආවරණය වන පරිදි) කටයුතු කරන අතර පොදුජන මතය වෙනස් වෙන ස්වභාවය දැන අවබෝධයෙන් කටයුකරන්නටද වගකීම පැවරේ .

## බෞතීස්මය ලැබූ සියළුම දෙනා සමග, විපරමින් ( the gift of "sensus fidei ")

4. සභාව යනු අති උතුම් ක්‍රිස්තු දේහයයි, දෙවියන් වහන්සේගේ ජනතාවයි,ශුද්ධාත්මයාණන්ගේ දේව මන්දිරයයි. බෞතිස්මයේ වරප්‍රසාදය පුද්ගලයකු ක්‍රිස්තු දේහයේ කොටස් කරුවෙකු කරන හෙයින් එම ජීවිතයට හා දූතකාර්යයට වගකීම පැවරෙයි. දෙවන වතිකානු මන්ත්‍රණ සභාව පවසන්නේ ශුද්ධවූ තැනන්වහන්සේගෙන් ආලේපිත ලත් විස්වාසිකයින්ගේ පූර්ණ දේහය ( 1 ජොහන් 2:20,27) විස්වාසය හා සබැඳි කාරණා වලදී නොමග යා නොහැකි බවයි. එම ගති ලක්‍ෂණය, ස්වාමින්වහන්සේ සභාවට හෙළිදක්වන්නාවූ නව මංපෙත්, දෝසවිරහිතව අවබෝධ කරගතහැකි , සහජසානුගත (නෛසර්ගික) සමර්ථභාවයෙන් හෙබි සමස්ථ දේව ජනතාවගේ, ආශ්චර්යමත් විශ්වාසයේ සංවේදීත්වය ලෙස අරුත් දැක්වෙයි.

ක්‍රිස්තු දේහය ලෙසින්, සභාව වනාහි දිව්‍යමය හා අධ්‍යාත්මික සත්‍යතාවයකි. එමෙන්ම පෘතුවිය මත සභාවේ පැවැත්ම හා එහි සාමාජිකයින් එහි මානය විදහා දක්වයි. පුණ්‍ය මිම්මෙන් සභාව ගැන අවබෝධ කරගැනීමට නම් ලෞකික හා ලෝකෝත්තර දෙමිම්මෙන්ම මැන බැලිය යුතු වේ. ලෞකික ව්‍යූහය තුල පමණක් රැඳී සභාව ගැන කරුණු-කාරණා විමසා බලන්නේ නම් සභාව , මනුෂ්‍ය සමාජීය කණ්ඩායමකට හා (synod) සමුළුව පාර්ලිමේන්තුවකට පමණක් සමාන බව දැකීමේ අනතුරට භාජනය වියහැක.

5. Synodality යනු ග්‍රීක වචනයකි - දල තේරුම නම් පොදු මාවත යන්නයි) පරිබාහිරව බලන කල, පොදු කන්-යොමුනුව තුල සැමදෙනාටම යමක් ඉගෙන ගන්නට හැකිවන යමක් අන්ථර්ගත පෘථග්ජන හා ධාර්මික ක්‍රියාවලියකි.
Synodality: මෙහිදී - යොමු කෙරෙන්නේ සභාවේ නියම සාරය හා වැඩදායක යතාර්ථය ක්‍රිස්තුදානය සඳහා ප්‍රයෝජනවත් සේ යොදා ගැනීමය. ඒ වූකලී සභාවේ සංස්ථාපිත ගමන් මග සහ වර්තමාන ලෝකයේ දිවැසිවර කාර්යයට නිදර්ෂනයකි

(Synodal) සමුළුවේ ක්‍රියාවලිය තුල ශුද්ධෝත්තම පිය, ප්‍රැන්සිස් පාප් තුමන් අදහස් කරන්නේ ශුද්ධාත්මයාණන් පෙළඹවීම් මත ලෝකයේ විවිධ ප්‍රදේශයන් හි විසිර සිටින විස්වාසිකයින් අතරේ කෙරෙන්නාවූ අනුනාදයට සභාව ඇහුම්කන් දීමයි.

(Synod) සමුළුවේ යනු - කෙනෙකුගේ තනි මතයක් හෝ න්‍යාය පත්‍රයක් තෙරපවන්න පිළියෙළ වූ තැනක්වත්, තීරණ ගැනීමට ජනතාව උසිගන්වන හෝ ජනතා නියෝජනයක් නැත්නම් පංගු-පේරු අල්ලන තැනක්වත් නොව,
දේව කැමැත්ත විමසා බලන්න,ශුද්ධාත්මයාණන්ට සවන් යොමුකරමින්
තෙවැනි සහස්- වර්ෂය සභාව රැගෙන යායුතු මාර්ගය සොයන්න බෞතිස්මය ලැබූවන් සම්භන්ධ කරගන්නා ප්‍රයත්නයකි . එබැවින්, නූතන ලෝකය හා එහි අභියෝගයනට අදාලව ආත්මයාණන් වහන්සේ සභාවට දෙන පණිවිඩය ( Revelation 2:7) අවබෝධයෙන් වටහා ගන්නට දරනා ප්‍රයත්නයට සක්‍රියව හවුල් වෙන්න සැම කතෝලිකයෙකුටම ආරාධනාවක් ඇත. මෙලෙසින් synodal ක්‍රියාවලියේ සහාගිවීම වනාහි ලෝකය තුල ක්‍රිස්තුදානයේ දූත මෙහෙවර අරඹයා, සහයෝගිත්වය හා සම්භාෂණය මගින් සභාවේ පැවැත්මට නව මාවත් මෙන්ම ක්‍රිස්තුදානයේ දූත මෙහෙවර සඳහා හවුල් වීමය.

# සමුළුවේ ක්‍රියාවලියෙහි නියැලෙමින්

6. ඉස්ලාමීය සමාජයක් මැද විවිධ රටවල් වල පුරවැසියන් හා විවිධ වූ සංස්කෘතීන් වලින් සමන්විත සංක්‍රමිකයන්ගේ සභාවක් ලෙසින් අපගේ සාක්ෂි දැරීම විශ්වීය සභා අන්තරයේ අද්විතීය හා වැදගත් වේ. සමුළුවේ ක්‍රියාවලිය සඳහා සියළුම විස්වාසිකයින් සම්භන්ධ කරගත හැක්කේ කෙසේද ? සමුළුවේ ක්‍රියාවලිය, මෙම විකාරියේට් දෙකෙහි මීසම් සහ විවිධ වූ සංඝයන් හතක සැලකියයුතු ජන-විවිධත්වයකින් යුතු ශ්‍රම සංක්‍රමික විස්වාසිකයින් අතරෙහි බෙදා ගත හැක්කේ කෙසේද ? අප වූ කලී විශේෂාකාරයෙන් වන්දනා ගමනක හා සර්වසාධාරණ ගති ලක්ෂණ පෙන්වන දේශීය සභාවකි.

වන්දනා ගමනක් ය යැයි කිවේ - මේ රටවල් වල නේවාසික අපට පුරවැසිභාවය නැත. අප මෙහි ජීවත්වන්නේ නිත්‍ය භාවය ගැන ස්ථිරත්වයකින් තොරවය. සර්වසාධාරණත්වය ලෙස සඳහන් කලේ අපේ බොහොමයක් මීසම් වල බොහොමයක් විස්වාසිකයින් විවිධ භාෂාවන් කථා කරන , විවිධ සංස්කෘතීන් ට අයත් වූවන්ය. එය හරියට අපෝස්තුළු වරුන්ගේ ක්‍රියා පොතේ සඳහන් පළමු පෙන්තකොස්තයේ රැස්වූ පිරිස මෙනි.

7. නිදහසේ රැස් වන්නට හා ගමනේ යෙදෙන්න මේ වසංගතය තවමත් බාධාවක් වී ඇති බව අපි දනිමු. කරුණු එසේ වුවද, එකමුතුකමින් වෙසෙන දේව ජනතාවක් ලෙස හා ක්‍රිස්තුන් වහන්සේගේ අනුගාමිකයින් ලෙසින් අපගේ කැඳවීම තුල; සෑම දෙනාගේම සම-සහභාගිත්වයෙන්, ඔබේ අපේක්ෂාවන් හා යෝජනා එක්කාසුකර ක්‍රියාත්මක කිරීම, අපට කල හැකි උපරිමයෙන් කටයුතු කරන්නට උත්සහ කරන්නෙමු. මේ වකවානුවේ අපේ ඇදහිල්ල මත රැදෙමින් විසීමයි , මගේ පැතුම ! තවද අප අතරේ ඇති සබැඳියාව හා ශුද්ධ ලියවිල්ලේ දිස්වෙන ජීවගුණයෙන් යුතුව මෙම ලිපියට තේමාවක් ලෙසින් මා තෝරාගත්තේ “දෙවියන් වහන්සේ ඔබ සමඟ සිටින බව අපි අසා ඇති බැවින් ඔබ සමඟ යන්න අපි කැමැත්තෙමු” (සෙකරියා 8 :23). මින් අදහස් වනුයේ "දේව ජනතාවක් ලෙසින් ජීවත්වන්නට " අප ලබා ඇති කැඳවීම තුල ජීවත්වියයුතු බවයි.

# සමුළුවේ ක්‍රියාවලිය ස්ථානික මට්ටමෙන්

8. අර්ධද්වීපයට නව රදගුරුතුමෙකුගේ පදවි ප්‍රාප්තිය ගැන අප අපේක්ෂාවෙන් ඉන්නා අතරේ synod දෙසට ගමන දැන්-දැන් ආරම්භ කිරීම යෝග්‍ය වේ. ෆැන්සිස් පාප් තුමන්ගේ අභිප්‍රාය පරිදි synodal සමුළුවේ ක්‍රියාවලිය දියත් විය යුත්තේ දේශීය සහා මට්ටමෙනි. එම අභිමතාර්තය සඳහා වඩාත් යෝග්‍ය වන්නේ වසමකට සීමිත වූ ආකාරයේ synod (සිනෝදයක ) නියැලීමයි .සෑම මිසමකම විස්වාසිකයින් පුද්ගලිකව හා විවිධ සංසයන් සමග ඇරැයුම් ලබනවා පහතින් සඳහන් දෑ මෙනෙහි කරන්නට:
විස්වාසිකයින් සමග අපගේ සමීප සම්හන්ධතාවය කෙබඳුද ?
මීසම හා සබැඳි දිවියේ අපගේ උනන්දුව හා සහාගිත්වය කෙසේද ?
අප එකිනෙකාගේ හැකියාවන් කෙසේ වුවත්, ක්‍රිස්තුන් වහන්සේ අප එකිනෙකාට දූත කාර්යයන් පවරා ඇති බව, අපි දැනුවත්ද ?

මගේ කල්පනාව නම් ස්වාමින්වහන්සේගේ ශුභ අස්නට අනුකූලව, සභාව තුල සම-සහාගිත්වයෙන් ජීවත්වන්නට අනුමත කළහැකි ප්‍රතිසංස්කරණයන් සම්බන්ධයෙන් විස්වාසිකයින්ට හඩක් නගන්න ඔවුන්ගේ අදහස්-උදහස් බෙදාගන්නට සෑම මිසමකටම අවස්ථාවක් දිය යුතුයි යන්නයි.එබැවින්, සෑම අයෙකුටම මම ආරාධනා කරන්නේ මෙම මාධ්‍ය -මෙවලම, තම අභිමතය පරිදි ප්‍රයෝජනවත් සේ යොදාගෙන මෙම අධ්‍යාත්මික ගමනේ කොටස් කාරයන් වන්නට ය. මෙය කලයුත්තේ විවිධ රටවල් හි අදාල විශේෂිත වූ තත්වයන් හා එකී මීසම් හි ප්‍රමාණය හා ව්‍යූ හයන් කල්පනාවට ගෙන බව මම හොඳින් දනිමි.

9. මේ වගේම අපගේ අවධානයට යොමුවියයුතු තවත් ක්ෂේත්‍රයන් ද ඇත.
බොහෝ දේ කරන්නට ඉතිරිව ඇති බව වටහා ගන්නට ෆ්‍රැන්සිස් පාප් තුමන් විසින් ලියන ලද ලිපි සහ වෙනත් ලේඛණ පිරික්සා බැලීම සෑහේ.
විවිධ වූ පැණයන් තව බොහෝ ඇත.ඉන් සමහරක් නම් :
වසංගතයට පෙර හා පසු සක්‍රමේන්තු දිවිය; දරුවන් යෞවනයන් හා වැඩිහිටියන් ඇදහිල්ල තුල හැඩගැස්වීම;
දේවස්ථානය තුල එක් එක් කර්තවයන් සඳහා සැදුම් ලත් ජන-කණ්ඩායම් සහ විකාරේටය තුල නියැලුම ;
ගරු පියවරුන් හා ගිහි ජනතාව අතරේ ඇති සම්හන්ධතාවය

පවුල් කෙරෙහි ඇති එඬේරික අවධානය හා සංක්‍රමික සභාව තුල කතෝලික විවාහයට ඇති අභියෝග,
අප අතරේ හා පිටස්තරයේ ඉන්නා දිළින්දන් ගැන සැලකිලිමත් වීම,
අන්තර්-ආගමික සම්බන්ධතාවයන්,
මීසම තුල සැම විස්වාසිකයකුගේම ක්‍රියාකාරී සහාගිත්වය
අභ්‍යන්තර සංනිවේදන හා සුභ-අස්න ප්‍රවර්ධන කටයුතු සඳහා විද්‍යුත් මාධ්‍ය බාවිතය
සභාවේ සේවාවන් සඳහා මුදල් අවශ්‍යතාවයන් හි අපගේ වගකීම ඉන් සමහරකි.

සැම දෙයක්ම එකවර වටහා ගන්නට අපට නොහැකි වුවද, පෞද්ගලිකව හෝ දායකත්වයක් නොදක්වා නිහඬව බලා සිටීමට වඩා , ප්‍රමාණවත් ලෙසින් ආරම්භයක් දීම හැමවිටම යෝග්‍ය වේ.

10. යෝජිත (synod ) සමුළුවේ ක්‍රියාදාමයට අනුකූලව යථා කාලයේදී සැම විකාරියේටයක් සඳහා සම්භන්ධිකාරකයින් නම් කෙරෙනු ඇත.
එසේ නිල ලබන තැනැත්තා රදගුරු තුමා සමග මෙම කර්තව්‍යයෙහි උපරිම ඵල නෙලීම සඳහා සමීපව කටයුතු කරනු ඇත.

මීසම් සංසයේ, සබැඳි කණ්ඩායම් වල හා බැතිමතුන් ගේ අදහස් -උදහස් ගොනු කර ගැනීම මෙම වර්ෂය අවසානයේ සිදු කෙරෙනු ඇත.

දේව ජනතාවගෙන් තොරතුරු විමසීම 'පෙර-සමළු ' රැස්වීමකින් සමාප්ත කෙරෙනු අතර,ඒ සමගම විකාරියේටය තුල මෙම කර්තව්‍ය හා සබැඳි ක්‍රියාදාමයද
සමාප්ත වනු ඇත. ඉන්පසුව රැස්කර ගත් දත්තයන් මෙම දිසා -භාගයේ රදගුරු සම්මේලන වෙත යොමු කෙරෙනු ඇත.
ප්‍රාදේශීය සභා වෙතින් ගොනු කරගත් කරුණු කාරනා , රදගුරු සම්මේලනය මගින්, රෝමයේ රදගුරු සමුළුවේ මහා ලේකම් කාර්යාලයේ අවධානයට යොමු කරන අතර, එතැනදී විවිධ මුණත් වලින් කෙටුම්පත් සැකසෙන අතර, එම කෙටුම්පත් 2023 සමුළුවේ සාකච්ජාවට,සියුම් නුවනින් වටහා ගැනීමට , විචාරවත් විමසීමට මුලාධාරයන් ලෙස යොදාගනු ඇත.

# "දෙවියන් වහන්සේ ඔබ සමඟ සිටින බව අපි අසා ඇත"

11 සභා ජීවිතයේ නව අදියරකට අප පා තබන්නේ කෙසේද ? ගීතිකාකරු මෙසේ කියයි " ඔබේ වචන මාගේ දෙපයට පහනක් ය; මාගේ මාවතට එළියක් ය" ගීතාවලිය 119 : 105).අසීසියේ සාන්ත ෆ්‍රැන්සිස් මුණි ,නව ජීවිත- රටාවකට රීතියක් සොයන්න එලබුණු අවස්ථාවේ, එයට මාර්ගෝප -දේශකත්වය පැතුවේ ශුද්ධවූ සුවිශේෂය තුළිණි. ක්‍රිස්තුන් වහන්සේගේ වචනය -දැසේ දැල්වෙන පහණ යි ; සමිඳාණන් වහන්සේ තමන්ගෙන් හා තම අනුගාමිකයන් ගෙන් කුමක්ද පතන්නේ යන්න එතුමා හොදින් අවබෝධ කරගත්තා සේ. දේව වාක්‍ය - ශුද්ධවූ ලියවිල්ල දෙසට හැරෙමු .දැල්වෙන පහණක් බඳු දේව වචනය තුලින් නව මංපෙතක් සොයමු .

අප සිතනා හා කරනා සැමදෙයකම පදනම වන්නේ හා වියයුත්තේ හෘදයංගම යැදුම යි.අවිලා හි සාන්ත තෙරේසා තුමිය පවසන්නේ " හැම යහපතකම ඇරඹුම - දණින් සමිඳුන් වෙතට, මගිනි" මුල් ක්‍රිස්තියානි සංසයන් හි තිබූ ධෛර්යයට හා නිර්භිතකමට පාදක වී ඇත්තේ එක සම්මුතියකින් මෙන්ම බැහැපත්ව , දැඩි භක්තියකින් හා අව්‍යාජ සිතකින් කරන ලද යැදුම යි.

ඔවුන්ගේ ව්‍යාපාර ආරම්භ කිරීමට පෙර හා ඔවුන්ගේ කාර්යයන්ට විරුද්ධත්වය හා බාධාවන් පැමිණි විට ඔවුහු නිරන්තරයෙන්ම යැඳුමට සම්භන්ධ වූහ.
ජේසු සමිඳාණ න් අපිට මතක් කරන්නේ 'මාගෙන් වෙන් ව කිසිවක් කරන්නට ඔබට නොහැකි (ජොහන් 15;5) බවය. බැහැපත්ව පැවතීමෙන් හා එතුමන්ගේ ස්ප්‍රිත්තුවේ හඬට කීකරු වීමෙන් අප භාග්‍ය ලබන්නේ දිවැස්වර සකරියාට අනුව 'දෙවියන්වහන්සේගේ ජනතාවක් ' වෙන්නටයි. ඒ සැම වර්ගයාම ඒක කේන්ද්‍රීය වීමටයි.

මම ඔබ සැමට ඇරයුම් කරන්නේ මෙම (synodal ) සමුළුවේ ක්‍රියාවලිය, අපේ දෛනික යැදුම් වලදී සිහිපත් කෙරෙන ලෙසයි. අපගේ සභාවට සහ මෙම (synodal) සමළු මග අරඹයා මහත් උනන්දුවකින් අපි යාච්ඤා කරමු,- විශේෂයෙන්ම ශුද්ධවූ දිව්‍ය පුජා යාගය තුල අපි යාච්ඤා කරමු

අපි දන්නවා "සමිදාණෝ ගෙය නොසාදන සේක් නම්, එය ඉදි කරන්නෝ නිකරුණේ වෙහෙසෙති.සමිදාණෝ නගරය රැක බලා නොගන්න සේක් නම්, මුරකරුවෝ නිකරුණේ පිබිද සිටිති." ( ගීතා 127 :1).අරාබියාවේ අප ආර්යාවෙනි, අප වෙනුවෙන් මැදහත් වුව මැනවි !

අබුඩාබි , අගෝස්තු 15, 2021
දේවමාතා වහන්සේගේ ස්වර්ගාරෝපිත මංගල්‍යය දින

+ පෝල් හින්ඩර් OFM Cap
දක්ෂිණ අරාබියාවේ අපෝස්තලික විකාර් හා උත්තර අරාබියාවේ අපෝස්තලික පරිපාලක

---

*Sinhala adaptation : Shanthalal Hettiarachchi, Abu Dhabi*

*Checked by :*
*Rev Fr. Roy Clarence ,*
*Chaplain of Catholic Community in the Vicariate of Southern Arabia*

APOSTOLIC VICARIATE
OF SOUTHERN ARABIA
The Catholic Church in UAE, Oman & Yemen

P.O. Box 54, Abu Dhabi
United Arab Emirates.
Tel: +971 2 446 1895
Email: info@avosa.org
www.avosa.org
@avosarabia